# 2018 අප්‍රේල් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

මෙම සභාවේ අටවන සැසි වාරයේ පළමු මාසික සභා රැස්වීම 2018.04.05 වන දින පෙ.ව.11.30 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

## 01. ගරු සභාපති තුමාගේ නිවේදන

I. පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රල්බ,පළාත් පාලන ආයතනයට අදාළ නීති, ප්‍රඥප්ති, රීති හා අතුරුව්‍යවස්ථා මහජන නියෝජිතයින්ට අවශ්‍ය ඕනෑම විටක පරිශීලනයට ගත හැකි අයුරින් කාර්යාලය තුල තබා ඇති බව ගරු සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදී.

II. සභා කටයුතු පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා,මන්ත්‍රීතුමියන්ලා දැණුවත් කිරීමේ වැඩමුළු ඉදිරියේදී දෙපාර්තමේන්තු මට්ටමින් පැවැත්වෙනු ඇති බව ද,අද දින ලබා දී ඇති රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටියෙහි (රීති) දැක්වෙන කරුණු අධ්‍යයනය කරන ලෙසද දන්වන ලදී.

## <u>02.සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් නොවී ය.

## <u>03. කල් දී ඇති යෝජනා</u>

I. විධායක ක්‍රියා ඉටුකිරීමේ බලය ගරු සභාපති තුමා වෙත පැවරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 8(1) ප්‍රකාර සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මේ පනතින් හෝ වෙනත් යම් නීතියකින් හෝ විධානය කරනු ලැබ ඇති හෝ බලය පවරනු ලැබ ඇති හෝ සියලු විධායක ක්‍රියා වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉටු කිරීම ,තම අත්සනින් නිවේදන නිකුත් කිරීම,ඇතුළු වෙනත් සුදුසු ආකාරයෙන් ක්‍රියා කිරීමේ බලය ,මෙම සභාවේ ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා වෙත පැවරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් කරන ලද ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

II. ඉදිරි මාසික සභා රැස්වීම් සඳහා දින නියම කිරිම .

ප්‍රාදේශීය සභාවල රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්යය පටිපාටි 2.(1) අනුව,2018 වර්ෂය සඳහා එක් එක් මාසයන්හි පළමුවන බ්‍රහස්පතින්දා දිනයන්හි පෙ.ව. 10.00 ට කාර්යාලීය රැස්වීම් ශාලාවේ දී සාමාන්‍ය මාසික සභා රැස්වීම පැවැත්වීම සුදුසු බව ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ඒඅනුව අදාල දිනයන් පහත දැක්වේ.

| මාසය | දිනය |
|---|---|
| 2018 - මැයි | 03 |
| - ජූනි | 07 |
| - ජූලි | 05 |
| - අගෝස්තු | 02 |
| - සැප්තැම්බර් | 06 |
| - ඔක්තෝම්බර් | 04 |
| - නොවැම්බර් | 01 |
| - දෙසැම්බර් | 06 |

නොවැලැක්විය හැකි හේතූන් මත එම දිනයන් වෙනස් කිරීමට සිදු වුවහොත් කල් ඇතිව දැනුම් දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඉහත යෝජනාව සභාවේ ඒකමතික එකඟතාවයෙන් යුතුව ස්ථිර විය.

III. ප්‍රාදේශීය සභා පනතේ 12(2) අනුව කමිටු පිහිටුවීම - 2018 වර්ෂය සඳහා

1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

2.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

3.කාර්මික සේවා කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමා

(ඉ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

4.පරිසර හා පහසුකම් කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

(ආ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

(ඈ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

5.ටෙන්ඩර් කමිටුව

(අ). ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

(ආ). ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

(ඇ). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

(ඈ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

(ඉ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

(ඊ).ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

(උ).ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්.රත්නාවතී මැණිකේ මෙනවිය

(ඌ). තාක්ෂණ නිලධාරී ඒ.එස්.ප්‍රදීප් මයා

(එ).සංවර්ධන නිලධාරී කේ.ඒ.රොෂාන් කුරුප්පු ආරච්චි මයා

ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම සඳහා ඉහත සඳහන් ආකාරයෙන් සැදුම් ලත් කමිටු පත් කිරීම සුදුසු බවත්,රු.5001/= සිට 500,000/= දක්වා වියදම් සීමාවක් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව වෙත පැවරීම සුදුසු බවත්,ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත විය.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය මෙම අවස්ථාවේ දී සභා ගැබෙන් ඉවත්ව යන ලදි.

## IV. චෙක්පත් අත්සන් කිරීමේ බලය ලබා දීම

නීත්‍යානුකූලව සහා අරමුදලින් කෙරෙන සියළු ගෙවීම් සඳහා චෙක්පත් අත්සන් කිරීමේ බලය දැනටමත් ලබා දී ඇති නිලධාරීන් වෙතම නොවෙනස්ව පවත්වාගෙන යාම සුදුසු බව ගරු සභාපති

කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මතවිය.

ඒ අනුව පහත නම් සඳහන් නිලධාරී මහත්ම මහත්මීන් වෙත චෙක් අත්සන් කිරීමට ලබා දී ඇති බලය තව දුරටත් බලාත්මක වේ.

- පළමු අත්සන්කරු - ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
- දෙවන අත්සන්කරු - සංවර්ධන නිලධාරී - ඩී.ඩබ්.ආර්.කොතලාවල මයා
  - සංවර්ධන නිළධාරී - ආර්.ඩී.ජී.වික්‍රමසිංහ මිය

V. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ යෝජනා අනුමත කර ගැනීම

මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදුව, මෙම අවස්ථාවේ දී තීරණ ගැනීම පසුවට කල් තබන ලදී.

VI. මිලදී ගැනීම් සහ ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම

1) තැපැල් මුද්‍රණ යන්ත්‍රය සඳහා ගෙවීම් කිරීම
කාර්යාලයීය දෛනික තැපැල සඳහා මුද්දර මුද්‍රා යන්ත්‍රයට වරකට රු.5,000/= බැගින් මුදල් අවසන් වන සෑම අවස්ථාවකදීම ‘රෙජිස්ට්‍රාර් ජෙනරාල්’වෙත ගෙවීම සඳහා අනුමැතිය ලැබිණ.

2) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද රංවල දිවුලකඩ මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.821,756.12/= ගෙවීමට සභාවේ අනුමැතිය ලැබිණ.

3)

| අනු අංකය | කාරණය | ගෙවිය යුතු ආයතනය | මුදල රුපියල් |
|---|---|---|---|
| 1 | සභාව සතු වාහන සඳහා ඇණවුම් අංක 561528-40 දක්වා ගෙවිය යුතු බිල්පත් | K.D.U.සමාගම ඉන්දන පිරවුම්හල පැල්මඩුල්ල | 79,718.70/= |
| 2 | සභා රැස්වීම් පැවැත්වීම සඳහා පුටු 15ක් ලබා ගැනීම | දම්රෝ ආයතනය | 242,895/= |
| 3 | කාර්යාලීය පරිභොජණය සඳහා 2018 පෙබරවාරි,මාර්තු ලබා ගත් ජල බෝතල් | පර්ල් මාකටිං | 12,250/= |
| 4 | 60*20 ප්‍රමාණයේ ක්ලෑම් සැඩල් 50ක් මිළ දී ගැනීම | සෑම් ඩෑම් ආයතනය | 15,496.87/= |

ඉහත ගෙවීම් සඳහා සභාවේ අනුමැතිය පල විය.

4) මිළ දී ගැනීම්

පහත මිලදී ගැනීම් වෙනුවෙන් සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණ

(අ).ගරු සභාපති තුමා,උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සඳහා නාම පුවරු 20 ක් හා අලුතින් පැමිණි නිලධාරීන් සඳහා නාම පුවරු 07ක් ලෙස නාම පුවරු 27ක් එකක් රු. 800/= බැගින් රු.21,600/=ක් වැය කර මීට පෙර නාම පුවරු සකස් කළ බලවින්න රසික ආර්ට්ස්"වෙතින් ඒ ආකාරයටම සකස් කරවා ගැනීම.

(ආ).මෙම ආයතනයේ තණකොළ කපන යන්ත්‍ර එකක් අලුත්වැඩියා කල නොහැකි තරමට අබලන් වී ඇති බැවින් නව යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සභාවේ මිල දී ගැනීම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් පල කර සිටි අතර ,

සියළු මිල දී ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඒවායේ කල් පැවැත්ම හා ගුණාත්මක භාවය පිළිබඳව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා විසින් අදහස් පල කර සිටි අතර මසකට වැය වන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව සීමාවක් පනවා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් අදහස් පල කරන ලදී.

## 4. වෙනත් කරුණු

## 4.2. ගරු මන්ත්‍රී මණ්ඩලයේ අදහස් දැක්වීම.

### 1. ගරු උප සභාපති ඩබ්ලිව්.ජී.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

මෙවර පළාත් පාලන ඡන්ද විමසීමට අදාල වූ මැතිවරණ ක්‍රමය කොට්ඨාශයකට සීමා වී ඇති බැවින්, ඒ ඒ කොට්ඨාශ නියෝජනය කරන ගරු මන්ත්‍රී තුමන්ලා මන්ත්‍රීතුමියන්ලා හට තමන්ගේ කොට්ඨාශයේ ජනතාවගේ ගැටළු වලට විසඳුම් සෙවීමේ භාරධූර වගකීම පැවරී ඇති බැවින්, ඉදිරියේදී ඊට අවශ්‍ය වටපිටාව නිර්මාණය කර ගැනීමට හැකි වේවා යි !ප්‍රාර්ථනා කරමින් ,ඒ සඳහා අවශ්‍ය සහයෝගය ගරු සභාපති තුමා විසින්,පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සභාවේ නියෝජිතයින් ලෙස විශ්වසනීයත්වයෙන් යුතුව ලබා දෙනු ඇතැයි, සඳහන් කළේය.සම්පත් හීන අඩු ආදායම් ලබන ප්‍රාදේශීය සභාවක් ලෙසින් වුව ද සියළු දෙනාගේ එකඟතාවයෙන් යුතුව සාර්ථක ගමනක් යාමට හැකි වේවායි නැවතත් ප්‍රකාශ කල ගරු උප සභාපති තුමා මෙවර මැතිවරණයෙන් මහජන නියෝජිතයකු ලෙස මෙම සභාවේ අසුන් ගැනීමට අවස්ථාව සලසා දීමට ඡන්දය ලබා දීමෙන් උදවු උපකාර කල ගල්පාය ප්‍රදේශයේ

ජනතාවට මෙන්ම බල ප්‍රදේශයේ සමස්ථ ජනතාවට ගෞරවණීය ප්‍රණාමය පල කරමින් මෙම සභාවේ කටයුතු සහයෝගයෙන් යුතුව කරගෙන යාමට හැකි වේවා යි සුභාශිංසනය කළේය.

## 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

2018 පළාත් පාලන ඡන්ද විමසීමේ දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය මත වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ජයග්‍රහණය කරවීමට ශක්තිය ලබා දුන් සියලු දෙනාට සිය ප්‍රණාමය පළ කළේය.එමෙන්ම සියලුම ගරු මන්ත්‍රී තුමන්ලා මන්ත්‍රී තුමියන්ලා පක්ෂ විපක්ෂ භේදය පසෙකලා සහෝදර සහෝදරියන් ලෙසින් ජනතා අපේක්ෂාවන් ඉටු කරමින් සභාවේ අභිවෘද්ධියට හේතුවන ආකාරයට කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රකාශ කල ගරු මන්ත්‍රී තුමා මෙම සභා බල ප්‍රදේශයේජනතාවගේ යටිතල පහසුකම් දියුණු කරමින් ,ආදායම් ප්‍රශස්ථමට්ටමට ගෙන ඒමට කටයුතු කරමුයි,අධිෂ්ඨාන පූර්වකව සඳහන් කරමින් සිය කථාව නිමාවට පත් කරන ලදී.

## 3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

පෙබරවාරි මස 10 වන දින පවත්වන ලද පළාත් පාලන ඡන්ද විමසීමේ මැතිවරණ ක්‍රමය තුලින් මෙම සභාවට මහජන නියෝජිතයින් විසිදෙනකු තේරිපත් වීම ඓතිහාසික වශයෙන් වැදගත් සිදුවීමක් බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා , හුණුවල බහු කොට්ඨාශයෙන් තරග වැද විශිෂ්ඨ ජයග්‍රහණයක් හිමි කර දී මෙම සභාවට පත්කර එවීමට සහය පළ කල ජනතාවට සිය හෘදයාංගම ස්තූතිය පිරිනමා සිටියේය. එමෙන්ම එම මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජනපෙරමුණ ජයග්‍රහණය කරන්නට ශක්තියක් වූ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. රංජිත් ද සොයිසා මැතිතුමාටත් සිය කෘතවේදීත්වය පල කළේ ය. පැරණි ගම් සභා ක්‍රමය නූතන ප්‍රාදේශීය සභා ක්‍රමය දක්වා විකාශනය වෙමින් නැවතත් කොට්ඨාශ ක්‍රමය තුළින් කාන්තා නියෝජනයට අවස්ථාව සැලසීම විශේෂත්වයක් බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, මහජනතාවවෙනුවෙන් පෙනී සිටින පිරිසක් ලෙස මහජන මුදල් ඵලදායි කාර්යයන් සඳහා හසුරවමින්, නිවැරදි දේ නිවැරදිව ඉටු කිරීමට ශක්තිය,ධෛර්ය ලැබේවා!යි ප්‍රකාශ කෙළ්ය.

එමෙන්ම ප්‍රාදේශීය සභා පනතින් ජනතාවගේ සුබසාධනය සුඛවිහරණය සඳහා පැවරී ඇති කාර්යය භාරයන් එහි සඳහන් ආකාරයෙන්ම හාමෙම ආයතනයේ දැක්ම මෙහෙවර සාක්ශාත් වන ආකාරයෙන් ඉටු කිරීමටත් නිවැරදි තීන්දු තීරණ මත සුරක්ෂිත සමාජයක් ගොඩ නගමින් හොදම ප්‍රාප්‍රාදේශීය සභාව බවට පත් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කළ ගරු මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාටත් , මන්ත්‍රීතුමියන්ලාටත් සුබ පැතුම් එක් කරමින් සිය කථාව නිමාවට පත් කරන ලදී.

## 4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

මෙවර පළාත් පාලන මැතිවරණයෙන් පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහනය කරවීමට සහය ලබා දුන් ප්‍රෙද්ශයේ ජනතාවටත්,කොට්ඨාශය ජයග්‍රහණය කරවීමට රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. රංජිත් ද සොයිසා මැතිතුමාටත් ශක්තියක් වෙමින් ඡන්ද ලබා දුන් සියළු

දෙනාටත් සිය ස්තූතිය පිරි නමා සිටි ගරු මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට සුබ පැතුම් එක් කෙළ්ය.

පසුගිය මැතිවරණ ක්‍රමය අනුව යහපත් ප්‍රථිඵල උදා වූ බවද සිහිපත් කළ ගරු මන්ත්‍රීතුමා කොට්ඨාශ ක්‍රමය ක්‍රියාත්මක වීම නිසා රංවල කොට්ඨාශෙය් නියෝජනයට මන්ත්‍රීවරුන් තිදෙනකු තේරී පත්වීම පිළිබඳව පෞද්ගලිකව සතුටු වන බවත් සඳහන් කෙළ්ය. තවද කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරුන් මෙන්ම සියළුම දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සැවොම එකතුවී ප්‍රදේශයේසංවර්ධනයට ඉවහල් වන වැඩ කොටස් ඉෂ්ඨ සිද්ධ කළ යුතු බව අධිෂ්ඨාන පූර්වකව සිහිපත් කරමින්,සද්භාවෙයන් යුතුව කල යුතු සියළු කටයුතු වලට සහය ලබා දෙන බව ද ප්‍රකාශ කෙළ්ය.

උඩෙවල - රංවල මාර්ගය අබලන් වීම මෙම ප්‍රාදේශීය සභාවේ ආදායම් මාර්ග ඇහිරීමට ප්‍රධාන හේතුවක් වී ඇති බව ද අවසන් වරට ප්‍රකාශ කල ගරු මන්ත්‍රී තුමා ඒ පිළිබඳව අදාල අංශ වල අවධානයට යොමුකල යුතු බව ද සිහිපත් කරමින්,සැමට සුබ අළුත් අවුරුද්දක් වේවායි සුභාශිංසනය කළේ ය.

## 5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

මැතිවරණයකට මුහුණ දී අද දින මංගල සභා රැස්වීමට සහභාගී වීමට වරප්‍රසාද හිමිකර දුන් හුණුවල කොට්ඨාශයේ ජනතාවට සිය ප්‍රණාමය පළ කරමින් සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමා පක්ෂයක් හැටියට මැතිවරණයට මුහුණ දීමට සිදු වුවත්, මැතිවරණ කටයුතු සුහදශීලීව ක්‍රියාත්මක කිරීමට හැකිවීම භාගයක් බව සඳහන් කළේය.

ඉදිරියේදී ද මෙම බල ප්‍රදේශයේ ජනතාවගේ ගැටළු හදුනාගෙන එක්ව කටයුතු කර ඔවුන්ගේ බලාපොරොත්තු හමුවේ ගැටුමක් නොමැතිව පැතුම් පුරවපු හදවත් ඇතිව කටයුතු කිරීම තුලින් ඉදිරියට යාමට හැකි වේවායි ප්‍රාර්ථනා කළේය.

## 6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දජිත් සමන්ජීව මැතිතුමා

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ නව සභාපතිතුමාට හා උප සභාපතිතුමාට සුභපැතුම් එක්කරමින් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේ මෙම සභාවේ අට වන සැසි වාරයට මහජන නියෝජිතයකු ලෙස තරග කිරීමට අවස්ථාව සලසා දුන් හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.වසන්ත මන්ත්‍රී තුමාට ස්තූතිය පිරිනැමිය යුතු බවයි. අනතුරුව ගරු මන්ත්‍රීතුමා විසින් බඳුල්ලේගම කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් පාට පක්ෂ භේදයකින් තොරව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රසාද් අසිත මන්ත්‍රීතුමා සමඟ එකතුවී වැඩකිරීමට සිය සහයෝගය සහ ශක්තිය නොඅඩුව ලබාදෙන බව අවධාරණය කළේය.

## 7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමා

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මැතිවරණ දිනන්න පහසු නමුත් මෙහි රැදී සිටීම අපහසු බව පවසා ඇති බවත්, එය සියළු දෙනාට ආදර්ශයක් වන බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා තම කොට්ඨාශයේ මාර්ග දැඩි ලෙස අබලන් වීම විශාල ගැටළුවක් බවත්,තමාට ඡන්දය ලබා දුන් ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට ගරු සභාපතිතුමාගේ සහය නොඅඩුව ලබා දෙනු ඇතැයි ,තමන් විශ්වාස

කරන බවත් ප්‍රකාශ කරමින්,තමාට ඡන්දය ලබා දුන් ජනතාවට සිය හෘදයාංගම ස්තූතිය පුද කරමින් සිය කතාව අවසන් කළේය.

## 8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්. රත්නපාල මැතිතුමා

දේශපාලනයට ඇතුලත්වීමට බලාපොරොත්තුවෙන් නොසිටි අයෙක් වුවත් ඒ සඳහා උදවු උපකාර කළ සියලු දෙනාටත් ඡන්දය ලබාදුන් සෑම දෙනාටත් සිය කෘතවේදී ප්‍රණාමය පළකල ගරු මන්ත්‍රීතුමා විසින් ඒ සඳහා උනන්දු කරවමින් ශක්තිය ධෛර්යය ලබාදුන් රත්නපුර දිසිත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. රංජිත් ද සොයිසා මැතිතුමාට සිය විශේෂ ස්තූතිය පිරිනමන ලදී. එමෙන්ම ඉදිරි සිව් වසර තුල ජනතාවට අවංක සේවයක් ඉටු කිරීමට සියලු දෙනාම එක්ව කටයුතු කරනු ඇතැයි ප්‍රකාශ කරමින් සිය කතාව නිමාවට පත්කරන ලදී.

## 9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

සිය දේශපාලන ගමන් මගට අත්වැලක් සැපයූ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධර්මපාල වීරසේකර මැතිතුමා සහ හිටපු සභාපතිවරයෙකු වූ දිවංගත උදේනි වීරසේකර මැතිතුමා මෙම අවස්ථාවේ සිහිපත් කළයුතු බව සඳහන් කරමින්,සභාව ඇමතු ගරු මන්ත්‍රීතුමා නවක මන්ත්‍රීවරුන් සඳහා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් විසින් දේශපාලන ජීවිතයේ ඉදිරි ගමන් මග සලසා දෙනු ඇතැයි විශ්වාසය පල කළේය. එමෙන්ම පසුගිය මැතිවරණයෙන් වැලිගෙපොල කොට්ඨාශය ජයග්‍රහණය කරවීමට සහය ලබාදුන් ජනතාවටත් සිය ගෞරවනීය ස්තූතිය පලකරන ලදී.

## 10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. උපුල් වසන්ත කුමාර මැතිතුමා

වැලිගෙපොල ප්‍රාදේශීය සභා ඉතිහාසය තුල ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන්නට අවස්ථාව සලසා දුන් නායකත්වයටත් පෞද්ගලික අභිමතාර්ථ නොසලකා ඡන්දය ලබාදුන් කොට්ටාශය තුල ජනතාවටත් හෘදයාංගම ස්තූතිය පල කරමින් සභාව ඇමතු ගරු මන්ත්‍රීතුමා වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සමස්ථ ජනතාවම තමාව පිළිගැනීම පිළිබඳ නැවතත් සිය සතුට සහ ප්‍රණාමය පල කළේය. එමෙන්ම මෙම සභාව විසින් ජනතාවාදීව ගනු ලබන තීන්දු තීරණ වලට නොපැකිළව සහය ලබාදෙන බවටත් එසේ නොවන අවස්ථා වලදී විරුද්ධව තමාගේ කාර්යභාරය ඉටු කරන බවත් අවධාරණය කරමින්, සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් කාර්ය මණ්ඩලයටත් සිය සහය ලබාදෙන බවත් ,සඳහන් කරමින් සිය දේශපාලන ජීවිතයේ ඉදිරි ගමන්මග සඳහා තමාටද සියලු දෙනාගේ සහය ලබාදෙනු ඇතැයි විශ්වාසය පල කරමින් සිය කථාව නිමාවට පත් කරන ලදී.

## 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

පසු ගිය කාලය තුල මැතිවරණයකට මුහුණ දී ජයග්‍රාහී ලීලාවෙන් පසුවන මොහොතක ගරු මන්ත්‍රීතුමා විසින් සිය අදහස් පල කරමින්,නීතිඥවරයෙකු වශයෙන් සිය වෘත්තියත් සමඟ දේශපාලනයට පිවිසීමේ අපේක්ෂාවක් නොතිබුණත් වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල හුදෙකලා වූ ගමක් හැටියට තමන් නියෝජනය කරණ කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් හඩක් නැගීමේ අවශ්‍යතාවය මත මැතිවරණයට ඉදිරිපත් වීමට සිදු වූ බව සඳහන් කළේය.මාර්ග දුෂ්කරතා මෙන්ම අනෙකුත් යටිතල පහසුකම් නොමැති එම කොට්ඨාශයේ ජනතාවට වත්මන් මැතිවරණ ක්‍රමය අනුව යමක් කරන්නට හැකි

වේ යැයි අධිෂ්ඨානයෙන් දේශපාලනයට පිවිසි බවත්, අවංක දේශපාලනය තුල විරුද්ධ වියයුතු තැන විරුද්ධ වන බවත් සහය අවශ්‍ය තැන සුහවාදීව කටයුතු කරන බවත් පැවසීය.

සමහර පළාත් පාලන ආයතන මෙන් ගැටුම්කාරී තත්වයන්ගෙන් බැහැරව ජනතාවාදී තීන්දු තීරණ වලට එළඹීමෙන් ජනතා සේවයට කැපවීමේ අවශ්‍යතාවය තවදුරටත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා එළඹෙන සිව් වසරක කාලය තුල සියළු දෙනා සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කළ යුතු බව ප්‍රකාශ කරමින් නිහඩ විය.

## 12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉතා දුෂ්කර ගම්මානයක් වූ යටිපස්ගමුව ප්‍රදේශයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක ලෙස තෝරා පත්කර එවීමට කටයුතු කළ රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමා ඇතුලු ප්‍රදේශවාසී ජනතාවට සිය කෘතවේදී ප්‍රණාමය පල කරමින් සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමිය බල ප්‍රදේශය තුල කාන්තාවන් වෙනුවෙන් හඬක් නගන්නට වත්මන් පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුලින් අවස්ථාව සැලසීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාටද සිය ප්‍රණාමය පල කළා ය. එමෙන්ම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සාකච්ඡා කරනු ලබන ගැටළු වලට සාධාරණ විසඳුම් ලබාදීමට ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ශක්තිය ධෛර්යය ලැබේවා!යිසුභාශිංසනය කරමින් සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා!යි ප්‍රාර්ථනා කළාය.

## 13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනීඊ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

තමා නියෝජනය කරනු ලබන්නේ ගරු සභාපතිතුමා නියෝජනය කරන කොට්ඨාශයේම වීම ශක්තියක් වූ බව සිහිපත් කළ මන්ත්‍රීතුමිය විසින්, එතුමියට මෙම අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාට සිය ස්තූතිය පලකර සිටින ලදී.අනතුරුව සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමේදී පක්ෂ විපක්ෂ බේදයකින් තොරව සහය ලබාදෙන බ වද ප්‍රකාශ කරමින් සිය කථාව නිමාවට පත්කරන ලදී.

## 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමා

නවක මන්ත්‍රීවරයෙකු වූ තමාට එම අවස්ථාව ලබා දුන් රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමා ඇතුලු ප්‍රදේශවාසී ජනතාවට සිය කෘතවේදී ප්‍රණාමය පල ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට සුභපැතුම් එක්කරමින් සිය කථාව නිමාවට පත් කරන ලදී.

## 15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

තමා දේශපාලනයට පිවිසියේ ජනතාව වෙනුවෙන් දැනට සිදු කරන මෙහෙයට වඩා වැඩි මෙහෙයක් ඉටු කිරීමේ බලාපොරොත්තුවෙන් බව පැවසූ ගරු මන්ත්‍රීතුමා,සමාජයට යම් කිසි මෙහෙයක් ඉටු කිරීමේ අභිලාශය කුඩා කල සිටම පැවති බැවින්, ප්‍රදේශයේ ජනතාවගේ නොයෙකුත් අවශ්‍යතා වලදී තමන් උපයා ගත් ධනයෙන් වැඩි කොටසක් දේශපාලන අරමුණු වලින් බැහැරව විය පැහැදම් කල බව අවධාරණය

කළේ ය.ඒ තුලින් තමාට ප්‍රදේශයේ විශාල කීර්තිනාමයක් ලැබී ඇති බව වැඩිදුරටත් සඳහන් කල ගරු මන්ත්‍රීතුමා දේශපාලනයට පිවිසීමෙන් තමා අපකීර්තියට පත් වූවා ද යන හැඟීමක් ඇති බව ද සඳහන් කළේ ය.

ඉදිරියේදි මෙම සභාවේ කාර්යය භාර්යය ඉටු කිරීමේදී පක්ෂ පාට නොසලකා සභාවත් ,ජනතාවත් අතර විශ්වාසය තබාගෙන පුංචි උදවුවක් හෝ කල යුතු බවට ඉල්ලීමක් කළේය.එමෙන්ම සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේ දී සභා අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් මධ්‍යම රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන වල දායකත්වය ලබා ගෙන ප්‍රදේශයේ ජනතාවගේ දැවැන්ත ප්‍රශ්න විසඳීමට ඉදිරි සැලැස්මක් සකස් කල යුතු බව පෙන්වා දුන්නේ ය.ඒ සඳහා සියළුම පක්ෂ දෙකම ඒකරාශී වී සාකච්ඡාමය තීන්දු තීරණ මගින් ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීමටත පියවර ගත යුතු බවත්, ඒ තුලින් වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ආදර්ශමත් සභාවක් ලෙස ඉදිරියට ගෙන යාමට කටයුතු කල යුතු බව පවසා සිටිමින් තමාගේ මෙහෙවර අගය කරමින් ඡන්දය දුන් ජනතාවට සිය ප්‍රණාමය පල කර සිටින ලදී.

## <u>16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා</u>

මෙම පළාත් පාලන ආයතනයට තමාව තෝරා පත්කර එවීමට කටයුතු කළ රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාට සිය ප්‍රණාමය පුද කරමින් සභාව ඇමතූ මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමාත් උප සභාපතිතුමාත් අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් හැටියට විශිෂ්ඨ සේවාවක් කිරීමට හැකිවන බව අවධාරණය කළේය. එමෙන්ම ගරු උප සභාපතිතුමා නියෝජනය කරන කොට්ඨාශයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් ඉදිරියේදී පක්ෂ භේදයකින් තොරව ජනතා සුභ සිද්ධිය සඳහා එකට වැඩ කිරීමේ අවශ්‍යතාවයද පෙන්වා දෙමින්, සභාව ගනු ලබන නිවැරදි තීන්දු තීරණ වලදී තමාගේ සහය නිබඳව ලබාදෙන බවද ප්‍රකාශ කළේ ය.අනතුරුව ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයට සුභ ප්‍රාර්ථනා කරමින් නිහඬ විය.

## <u>17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිනිය</u>

කණ්ඩායම් වශයෙන් දේශපාලනයට පිවිසියත්, අද දින මංගල සභා රැස්වීමට ආධුනික මන්ත්‍රී වරියක ලෙස සහභාගී වන මේ මොහොතේ සුහවාදීව කටයුතු කළ හැකි පරිසරයකට ඇතුළු වී ඇති බවක් හැඟෙන බව ප්‍රකාශ කරමින් අදහස් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමිය පෞද්ගලික මතවාද මත දේශපාලනයට පිවිසියත් මේ පරිසරය තුල පොදු එකඟතාවයන් මත ගමට සේවයක් කිරීමට හැකි වන බව හැඟීම්බරව සඳහන් කළාය.

අනතුරුව සිය දේශපාලනයට අත්වැලක් සැපයූ රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාටද සිය කෘතවේදී ප්‍රණාමය පල කළාය. එමෙන්ම මෙම කොට්ඨාශය සහ ආසනය ප්‍රසාදයට පත්වන ඉදිරියේදී ලැබෙණ ප්‍රතිපාදන ඉතාම අවහය තැනට ලබාදෙමින් මතවාද මත ගැටුම් නොමැතිව හොඳම දේ හොඳින් කිරීමට සියලු දෙනාම ඒකරාශි වී වැඩ කරමුයි අධිෂ්ඨානපූර්වකව සඳහන් කරමින් හෙට දවස වඩාත් ශක්තිමත් කිරීමට සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවායි සුභාසිංශන කළාය.

## 18.ගරු විපක්ෂ නායක එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

මෙම සභාවේ අටවෙනි සැසි වාරයේ සමාරම්භක උළෙල හා මංගල රැස්වීම පැවැත්වීමේ කටයුතු ඉතා උත්කර්ශවත් ලෙස සංවිධානය කර තිබීම පිලිබඳව ගරු සභාපතිතුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට පළමුවෙන්ම සිය ස්තූතිය පල කළේය. අනතුරුව මෙම සභාවේ හිටපු සභාපතිවරයෙකු ලෙස වැලිගෙපොල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවට ඉමහත් සේවයක් කළ සිය පියාගේ දේශපාලන ගමන් මග ඉදිරියට ගෙනයාමට එතුමා දුන් ශක්තිය නමස්කාර පූර්වකව සිහිපත් කරමින් මංගල සභා රැස්වීම ඇමතූ ගරු මන්ත්‍රීතුමා තමන්ට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට ජයග්‍රහණය කර එවීමට අවස්ථාව සලසා දුන් කොට්ඨාශයේ සමස්ථ ජනතාවට සිය කෘතවේදී ප්‍රණාමය පල කළේය. එමෙන්ම තමන්ට දේශපාලන නායකත්වය ලබාදෙන ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්,රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාත් සාඩම්බරයෙන් සිහිපත් කරමින් අද දින ගරු සභාපතිතුමා විසින් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව වැඩ ආරම්භ කිරීම පිළිබඳවද සතුට පල කරමින් උත්සව අවස්ථාවට රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාටද සහභාගී වීමට ආරාධනා කළයුතුව තිබූ බවටද අදහස් පල කළේය.

එමෙන්ම මෙම සභා බල ප්‍රදේශයේ උන්නතියට කැප වූ හිටපු සභාපතිවරුන් වන උදේනි වීරසේකර මැතිතුමා මෙන්ම සිය පියාණන් වූ එච්. ඒ. විජේරත්න මැතිතුමා පක්ෂ විපක්ෂ සියලුදෙනා සමඟ ඉතා සුහදශීලීව කටයුතු කල ආකාරය සිහිපත් කළ ගරු මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමාගේත් උප සභාපතිතුමාගේත් මග පෙන්වීම යටතේ මෙම පළාත් පාලන ආයතනයේ කාර්යභාරයන් ඉටු කිරීමේදී කාර්ය මණ්ඩලයේත්, පක්ෂ විපක්ෂ මන්ත්‍රී මණ්ඩලයේත් අන්‍යොන්‍ය සහය අපේක්ෂා කරන බවද ජනතාවාදීව ගනු ලන තීන්දු තීරණ වලදී නොපැකිලව සහය ලබාදෙන බවද පැවසීය. ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලැබී ඇති බැවින් ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂාන් විතානගේ මැතිතුමාගේ සහයද තමාට ලබාගතහැකි බැවින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සියලු දෙනාම කැපවීමෙන් කටයුතු කිරීමේ අවශයතාවය නැවතත් පැහැදිලි කර දෙමින් ඒ සඳහා සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කළේය.

මෙවර ප්‍රාදේශීය සභාවේ කණ්ඩායම් නායක වශයෙන් තමාව තෝරා එවීමට කටයුතු කළ ගරු හේෂාන් විතානගේ මැතිතුමාට නැවතත් සිය ස්තුතිය පල කරමින් ගරු සභාපතිතුමා උප සභාපතිතුමා යන දෙපලට උණුසුම් සුභ පැතුම් එක් කරමින් සමස්ථ මන්ත්‍රී මණ්ඩලයටත් ප්‍රදේශවාසී සියලු දෙනාටත් සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින් සිය අදහස් පල කිරීම නිමාවට පත් කරන ලදී.

## ගරු සභාපති කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

මෙම පලාත් පාලන ආයතනයේ මන්ත්‍රී වරයෙකු ලෙසත් සභාපතිවරයෙකු ලෙසත් තම දේශපාලන ජීවිතය තුල අත්දැකීම් බහුල අයෙකු ලෙස අදහස් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා එම කාලය තුල මෙම ආයතනය නගා සිටුවීම සඳහා තමා විසින් ගන්නා ලද උත්සාහයත් ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. රංජිත් ද සොයිසා මැතිතුමාගෙන් ලැබුණු පිටුවහලත් මත පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් මෙම බල ප්‍රදේශයේ සියලුම කොට්ඨාශ පොදු ජන පෙරමුණ ජයග්‍රහණයට හේතු වූ බව පැවසීය. එමෙන්ම මෙවර මෙම පළාත් පාලන ආයතනයට සභාපතිවරයා වශයෙන් තමාවත් උප

සභාපති වශයෙන් සමන් ජීවලාල් මැතිතුමාත් තෝරා පත්කර ගැනීමට කටයුතු කළ රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු රංජිත් ද සොයිසා මැතිතුමාට සිය ගෞරවණීය ප්‍රණාමය පලකර සිටින ලදී.

එමෙන්ම පසුගිය පාලන කාලය තුල සියලුම මන්ත්‍රීවරුන් සහයෝගයෙන් කටයුතු කළ ආකාරය සිහිපත් කළ ගරු සභාපතිතුමා මෙවර මැතිවරණ ක්‍රමය අනුව හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන කරුණාසේන ගුරුගේ,කේ.ඒ.වසන්ත, ධර්මපාල වීරසේකර, යන මන්ත්‍රීවරුන් ඉවත් වූයේ වෙනත් අයෙකුට එම අවස්ථාව ලබාදීමේ ඕනෑකම නිසාම බවත් එසේ වුවත් හිටපු කාලය තුල ඔවුන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කළ මෙහෙය අගය කළයුතු බවත් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා ඔවුන් පක්ෂය දිනවන්නට කැපවීමෙන් කටයුතු කළ බව කෘතවේදීව සිහිපත් කළේය.

එමෙන්ම මෙම පළාත් පාලන ආයතනය තුල අතීතයේ සිටම සියලුම මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජනතා සුභසිද්ධිය සඳහාම ක්‍රියාකළ ආකාරය සිහිපත් කරවමින් පසුගිය පාලන කාලයේදී විපක්ෂ මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කළ එච්.ඒ. විජේරත්න මැතිතුමාද ඉතාමත් සුහදශීලීව තම කාර්යභාරය ඉටුකළ බැවින් මෙම පාලන කාලය තුලද ආසනයේ දේශපාලන නායකත්වය හොබවන රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී.රංජිත් ද සොයිසා මැතිතුමාගේ මෙන්ම ජනතාව තුල ඇති විශ්වාසය ආරක්ෂා වන අයුරින් මතගැටුම් වලින් තොර ගෞරවණීය ප්‍රාදේශීය සභාවක් ලෙස ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට සියලු දෙනාගේ සහය ලැබෙණු ඇතැයි විශ්වාසය පල කළේය.

එමෙන්ම ධූරධාරීන් නොමැති කාලය තුල කාර්යමණ්ඩලයට එම කටයුතු කරගෙන යාමේදී තමා විසින් කිසිම අවස්ථාවක කිසිදු ආකාරයේ බලපෑමක් නොකල බවද එම කාලය තුල ආයතනය පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකල ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ගෞරවය හිමිවිය යුතු බවද ප්‍රකාශ කල ගරු සභාපතිතුමා විසින් බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඵලදායී සේවයක් ඉටු කිරීමට සියලු දෙනාගේම සහය ලබාදෙනු ඇතියි විශ්වාසය පල කරමින් සභාවේ කටයුතු පස්වරු 4.00 ට නිමාවට පත් කරන ලදී.

කේ.ඕ.කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.